ප්‍රවේශ පත්‍ර ලැබුණු වහාම අයදුම්කරුවන්ට ලබා දෙන්න. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර ලබා දීම ප්‍රමාද කිරීම නිසා ඇති වන අපහසුතා පිළිබඳ ව වගකීම ඔබ සතු ය.

DP/OL/2026/07/01

මගේ අංකය : 6/4/OL/2026
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026.11.12

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026

ඔබ විදුහලේ විභාග අයදුම්කරුවන්ට නියමිත විභාග අංක සහ විභාග මධ්‍යස්ථානය දැක්වෙන (පරිගණකයෙන් මුද්‍රිත) පැමිණීමේ ලේඛනයේ පිටපතක් හා විභාග ප්‍රවේශ පත්‍ර මේ සමග එවා ඇත.

1. ඔබ විදුහලට අද්දාළ විභාග ප්‍රවේශ පත්‍ර ලැබුණු **වහාම** ඒවා, පන්තිභාර ගුරුභවතා මඟින් අයදුම්කරුවන්ට ලබා දී **ඔවුන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ඉල්ලා ඇති විෂයයන්, විෂයය අංක හා භාෂා මාධ්‍යය** පරීක්ෂා කර නිවැරදි ද යන්න සනාථ කර ගත යුතු ය.

   විශේෂයෙන් ම පහත සඳහන් විෂයයන් නිවැරදිදැයි තහවුරු කර ගන්න.

   - ✶ ආගමික විෂයයන්
   - ✶ පළමු විෂයය කාණ්ඩයට අයත් විෂයයන්
   - ✶ දෙවන විෂයය කාණ්ඩයට අයත් විෂයයන්
   - ✶ තෙවන විෂයය කාණ්ඩයට අයත් විෂයයන්

   } එක් විෂයය කාණ්ඩයකින් එක් විෂයයකට පමණක් පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. එසේ සනාථ කරගැනීමෙන් පසුව ප්‍රවේශ පත්‍ර **වහාම** අයදුම්කරුවන් වෙත ලබා දිය යුතු ය. එසේ කළ බවට ලොග් සටහනක් යොදන්න.

3. පාසල් හැරයාම හෝ වෙනත් හේතුවක් මත හෝ ප්‍රවේශ පත්‍ර ලබාගැනීමට නොපැමිණි අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර සුරක්ෂිතව තබා ගත යුතු වේ. එවැනි අයදුම්කරුවන් විභාගයට පෙර පැමිණ ප්‍රවේශ පත්‍ර ඉල්ලා සිටියහොත් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදන්න.

4. **ප්‍රවේශපත්‍ර සංශෝධන කිරීම**

   - අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍රවල **විෂයය සංශෝධන, මාධ්‍යය සංශෝධන, නම හෝ ජාතික හැඳුනුම්පත් අංක සංශෝධන, ස්ත්‍රී/පුරුෂ භාවයේ සංශෝධන** හා **උපන්දිනයේ සංශෝධන** ඇත්නම් **2026 නොවැම්බර් මස 19 වන දින සිට 2026 නොවැම්බර් මස 30 වන දින දක්වා** ඇති කාලසීමාව තුළ විභාග දෙපාර්තමේන්තුවේ http://onlineexams.gov.lk වෙබ් අඩවිය වෙත පිවිස මාර්ගගතව එම සංශෝධන සිදු කර ගත යුතු ය.
   - **එක් අයදුම්කරුවකුට යම් සංශෝධනයක් සිදු කිරීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.**
   - නාම සංශෝධනය හෝ ජාතික හැඳුනුම්පත් අංක සංශෝධනය යන දෙකෙන් **එකක් පමණක්** මාර්ගගතව සිදු කිරීමට අවස්ථාව ලබා දේ.
   - **සංශෝධනය කිරීමට ඇත්තේ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් නම්, විදුහල්පති විසින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටුපස අත්සන සහතික කරන ස්ථානයේ නිවැරදි ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර, මාර්ගගත සංශෝධනය ද සිදු කර, එහි බාගත කළ පිටපත සහතික කර ඒ සමග විදුහල්පති විසින් සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද ප්‍රවේශ පත්‍රයට අමුණා අයදුම්කරු වෙත ලබා දිය යුතුය.**

- **නම සහ ජාතික හැඳුනුම්පත් අංකය යන දෙකෙහිම සංශෝධන පවතී නම්, නාම සංශෝධනය පමණක් මාර්ගගතව සිදු කර ජාතික හැඳුනුම්පත් අංකය සංශෝධනය කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතු ය. ඒ සමඟ පහත ලේඛන ද රැගෙන ආ යුතු ය.**
    - අයදුම්කරුගේ තොරතුරු සහතික කරන ලද විදුහල්පති විසින් නිකුත් කරනු ලබන ඉල්ලීම් ලිපිය
        * අයදුම්කරුවන් 10 දෙනෙකු හෝ ඊට වඩා වැඩි නම් අයදුම්කරුවන්ගේ තොරතුරු පොදු ලේඛනයකට ඇතුළත් කර, ඔවුන්ගේ **විභාග අංක** සහ ඊට අදාළ **නිවැරදි ජාතික හැඳුනුම්පත් අංක** සඳහන් Excel මෘදු පිටපතක් (Softcopy) සංයුක්ත තැටියකට (CD) ඇතුළත් කර විභාග දෙපාර්තමේන්තුව වෙත ගෙනවිත් භාර දිය යුතුය.
    - අයදුම්කරුගේ විභාග ප්‍රවේශ පත්‍රයෙහි මුල් පිටපත
    - මාර්ගගතව නාම සංශෝධනය සිදු කර බාගත කරගන්නා ලද පිටපත
    - අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි විදුහල්පති සහතික කරන ලද ඡායා පිටපතක්

- මාර්ගගත සංශෝධනයන් සිදු කර ගැනීමෙන් පසු නැවත මාර්ගගත සංශෝධනයකට අවස්ථාවක් නොමැති බැවින් අවශ්‍ය සංශෝධනය නිවැරදිව තීරණය කිරීමෙන් පසු එම සංශෝධනය සිදු කර ගත යුතුය.
- මාර්ගගතව සිදුකරනු ලබන සියලුම සංශෝධන සඳහා අදාළ සංශෝධිත ආකෘතිය බාගත කර, එය විදුහල්පති විසින් සනාථ කිරීමෙන් අනතුරුව විභාග ප්‍රවේශ පත්‍රය සමඟ අමුණා අයදුම්කරු වෙත ලබා දෙන්න.

5. **එසේම විශේෂ හේතුවක් මත සිදු කළ යුතු මධ්‍යස්ථාන මාරු කිරීම් සඳහා ද විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතු ය. (විශේෂ හේතුව තහවුරු කළ හැකි ලිපි ලේඛන ද සහිතව)**

6. පාසල් අයදුම්කරුවන්ගේ සෑම සංශෝධනයක් ම විදුහල්පති මගින් සිදු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් අයදුම්කරුවන් හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් අය විසින් පෞද්ගලිකව හෝ කෙරෙන ඉල්ලීම් පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව ක්‍රියා නොකරන බව දන්වන අතර, ඒ සම්බන්ධයෙන් අයදුම්කරුවන් දැනුම්වත් කරන ලෙසත් කාරුණිකව දැනුම් දෙමි.

7. **2026.11.30 දින මධ්‍යම රාත්‍රී 12.00න් පසු** මාර්ගගත පද්ධතිය ස්වයංක්‍රීයව අක්‍රිය වන බැවින් එදිනෙන් පසු කිසිදු සංශෝධනයක් සිදු කර ගැනීමට හැකියාවක් නොමැත. එබැවින් නියමිත කාල සීමාව තුළ මාර්ගගතව සංශෝධන සිදු කර නොගැනීමෙන් ඇති වන අහිතකර තත්ත්වයන්ගේ වගකීම සම්පූර්ණයෙන් ම ඔබ වෙත පැවරෙන බව කරුණාවෙන් සලකන්න.

8. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම, විදුහල්පති හෝ නියෝජ්‍ය විදුහල්පති විසින් ම අයදුම්කරු තමා ඉදිරිපිටදී අත්සන් කිරීමෙන් අනතුරුව සිදු කළ යුතු ය.

9. අත්සන සහතික කිරීමෙන් තොරව ප්‍රවේශපත්‍ර බෙදා දීමෙන් වලකින්න.

10. අපේක්ෂකයා අත්සන සහතික කරන ස්ථානයේ යොදන අත්සනම, විභාගයට පෙනී සිටින අවස්ථාවේදී ද ප්‍රවේශ පත්‍රයේ යෙදිය යුතු බව දැනුවත් කරන්න.

11. සෑම අයදුම්කරුවකුට ම ඔහුට/ඇයට හිමි නියමිත (පරිගණකයෙන් මුද්‍රිත) ප්‍රවේශ පත්‍රය භාරදිය යුතුයි. ප්‍රවේශ පත්‍රයේ වෙන් කළ හැකි කොටසේ අයදුම්කරුගේ විභාග අංකය, කාලසටහන හා විෂය ලේඛනය සඳහන් කර ඇති බැවින් පළමු දින විභාග මධ්‍යස්ථානයට පැමිණීමට පෙර, එම කොටස වෙන්කර තබා ගන්නා ලෙසට අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දෙන්න. [එහි සඳහන් තමන්ට අදාළ විෂයයන් සඳහා දිනය/වේලාව/වරුව අනුව නියමිත විභාග මධ්‍යස්ථානයට පැමිණීම සඳහා]

12. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් රැස් කර විභාග නීති රීති හා උපදෙස් එකිනෙක විස්තර කර දෙන මෙන් කාරුණිකව දැනුම් දෙමි. විභාග ශාලාවේ දී වංචනික ක්‍රියාවන් කරන අයදුම්කරුවන්ට 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත යටතේ දඬුවම් පැමිණවීමට කටයුතු කරන බැවින් විභාග වංචාවලින් වළකින ලෙසට, පහත දක්වා ඇති කරුණු කෙරෙහි ද අවධානය යොමු කරවමින් අයදුම්කරුවන්ට තරයේ උපදෙස් ලබා දිය යුතු ය.

- දිනපතා විභාග කාලසටහන පිළිබඳව නිසි අවබෝධයෙන් සිටීම
- විභාගයට ඉදිරිපත් වීමේදී ප්‍රවේශ පත්‍රය හා අනන්‍යතා පත්‍රය රැගෙන යාම
- නියමිත වේලාවට පැය 1/2 කට වත් කලින් විභාග ශාලාවට යෑම **(ප්‍රමාද වී පැමිණෙන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර ලබා නොදේ.)**
- ප්‍රශ්න පත්‍රවල ඇති උපදෙස් කියවීම හා ඒ අනුව කටයුතු කිරීම
- පිළිතුරු ලියන කඩදාසිවල දක්වා ඇති ස්ථානයන්හි ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග අංකය යෙදීම
- පිළිතුරු සැපයීමේදී කාල කළමනාකරණය කිරීම කෙරෙහි සැලකිලිමත් වීම
- අයදුම්කරුවන්ට ගැටළු මතු වූ අවස්ථාවලදී ශාලාධිපති වෙත දැන්වීම
- විභාග ශාලාවලට රැගෙන යා හැකි හා නොහැකි දේ පිළිබඳ දැනුම්වත් කිරීම (විද්‍යුත් උපකරණ/ මකන දියර/ ජංගම දුරකථන ආදිය...)
- වංචනික ක්‍රියා සිදු කිරීමට උදව් දීම හෝ උදව් ගැනීම තහනම් බව
- විනය විරෝධීව කටයුතු කරන අයදුම්කරුවන්ට විභාග නීති අනුව දඬුවම් ලබා දෙන බව
- විභාග ශාලාවෙන් පිටතට කිසිදු කඩදාසියක් රැගෙන යාම නීති විරෝධී බව
- විද්‍යුත් උපකරණ රැගෙන යාම තහනම් බව
- තම අනන්‍යතාවය පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකි වන අයුරින් සහ කන් දෙක පැහැදිලිව විවෘතව පෙනෙන ලෙස පහත දිස්වන පරිදි විභාගයට පෙනී සිටින සම්පූර්ණ කාල සීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.



13. එක සමාන නම් ඇති අයදුම්කරුවන් ඔබ විදුහලේ සිටිත් නම්, ඔවුන් වෙත ප්‍රවේශ පත්‍ර බෙදා දීමට පෙර එම අයදුම්කරුවන්ගේ **සම්පූර්ණ නම් ද ඔවුන් පෙනී සිටින විෂයයන් ද** පැමිණීමේ ලේඛනයේ පාසල් පිටපත ද පරීක්ෂා කිරීමෙන් පසුව ප්‍රවේශ පත්‍ර නියමිත අයදුම්කරුවන් වෙත ම භාර දිය යුතු ය.

14. සෑම අයදුම්කරුවකුම තමන් ප්‍රශ්න පත්‍රයකට ඉදිරිපත් වන සෑම අවස්ථාවකදී ම තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය.

අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා භාරගනු ලබන්නේ ;

- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රයක් හෝ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ඡායාරූපය සහිත තාවකාලික ලියවිල්ල
- වලංගු විදේශ ගමන් බලපත්‍රයක්
- වලංගු රියදුරු බලපත්‍රය

15. විභාග දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව පැමිණීමේ ලේඛනයේ හෝ ප්‍රවේශ පත්‍රවල හෝ කිසිම සංශෝධනයක් නොකළ යුතු අතර, අවශ්‍ය වූ විටෙක විස්තර ලබා ගැනීම සඳහා පැමිණීමේ ලේඛනය සුරක්ෂිතව තබා ගන්න.

16. ඔබ පාසලේ විභාග මධ්‍යස්ථාන පිහිටුවා ඇත්නම්,

- විභාගය සාර්ථකව පැවැත්වීමට ශාලාධිපතිවරුන්ට අවශ්‍ය සහාය ලබා දිය යුතුය. (අවශ්‍ය පහසුකම් සහිත ශාලා සහ ඩෙස් පුටු)
- ආරක්ෂක නිලධාරීන් හෝ මුරකරුවන් දැනුම්වත් කර පාසල් පරිශ්‍රය තුළට බාහිර පුද්ගලයින් ඇතුළු වීම පාලනය කළ යුතු ය.

- අපේක්ෂකයන්ට බාධා වන කටයුතු කිසිවක් පාසල් පරිශ්‍රය තුළ සිදු නොවීමට වග බලා ගත යුතු ය.
  (උදා :- ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු, තූර්ය වාදක කණ්ඩායම් පුහුණු වීම්, උත්සව කටයුතු, රැස්වීම්)

  එවැනි පැමිණිලි වාර්තා වුවහොත් 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විහාග පනත යටතේ කටයුතු කිරීමට සිදු වන බව දන්වමි.

17. උක්ත කරුණ සම්බන්ධයෙන් යම් විමසීමක් සිදු කළ යුතු නම් පහත දුරකථන අංක ඔස්සේ විමසීම් කළ හැකි අතර මෙම විභාගය පැවැත්වීම සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

දුරකථන අංක : 0112784537/0112784208
ෆැක්ස් අංක : 0112784422
විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්